(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(14).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 මැයි 11 බදාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 46/2022

ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු තිස්ස අත්තනායක මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා
ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු තලතා අතුකෝරල මහත්මිය
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු පලනි දිගම්බරම් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු රෝහණ බංඩාර මහතා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය යෝග්‍ය පරිදි ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ පාර්ලිමේන්තුවේ අප්‍රසාදය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මහජන ආරක්ෂාව හා සම්බන්ධ තත්කාලීන නීතිය ඇතුළු කිසියම් ලිඛිත නීතියක් යටතේ වන තම බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේදී හා ඉටුකිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 42 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු වන හෙයින් ද;

තවද, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මහතා 2019 නොවැම්බර් 17 වන දින ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබ මේ දක්වා එම ධුරය දරනු ලබන හෙයින් ද;

තවද, තමා තෝරාපත් කර ගනු ලැබූ වහාම ජනාධිපතිවරයා විසින් තම සහෝදරයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මහතා අග්‍රාමාත්‍යවරයා වශයෙන් පත්කරනු ලැබ, රජයක් පිහිටුවන ලෙස ඔහුට ආරාධනය කරනු ලැබ, ඔහු විසින් එසේ රජයක් පිහිටුවනු ලැබූ හෙයින් ද;

තවද, 2020 පෙබරවාරි මස අවසානයේ දී තමන් විසින් කැඳවනු ලැබීම සඳහා හිමිකම් තිබූ මහ මැතිවරණය ජයග්‍රහණය කිරීමේ අපේක්ෂාවෙන් 2019 දෙසැම්බර් මාසයේදී ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් යුතු රජය විසින් බදු සහන මාලාවක් නිවේදනය කරනු ලැබූ හෙයින් ද;

තවද, ඉහත කී බදු සහන හේතුවෙන් රජයට තම අපේක්ෂිත ආදායම 25% ක ප්‍රමාණයකින් අහිමි වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රේණිගත කිරීම් 2020 අප්‍රේල් වනවිට B සිට B- දක්වා සහ 2020 නොවැම්බර් මාසය වනවිට CCC දක්වාත් විශාල වශයෙන් පහත වැටී ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල් වෙතින් තවදුරටත් ණය ලබා ගැනීමට රටට අවහිරතාවයක් ඇති වූ හෙයින් ද;

තවද, 2021 අප්‍රේල් මාසයේ දී හෝ ඒ ආසන්න කාලයක දී ජනාධිපතිවරයා විසින් රසායනික පොහොර භාවිතය තහනම් කිරීමට නියෝග කරනු ලැබ එකී නියෝගය වහාම ක්‍රියාත්මක වන පරිදි ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අප්‍රමාණ දුෂ්කරතාවයන් සහ විවිධ භෝගවල සුවිශාල අස්වනු හානියක් සිදු වූ හෙයින් ද;

තවද, කොවිඩ්-19 වසංගත තත්ත්වය පිළිබඳව කටයුතු කිරීමේ දී නිසි ක්‍රියාවලියක් දක්නට නොලැබුණු අතර විශේෂඥ විද්‍යාත්මක උපදෙස් ද නොසලකා හරිමින් ජනාධිපතිවරයා විසින් රට පුරා හමුදාකරණය වර්ධනය කිරීමට හා පුළුල් කිරීමට කොවිඩ්-19 වසංගත තත්ත්වය භාවිත කරනු ලැබූ හෙයින් ද;

මිත්‍යාව මත පදනම් වූ ප්‍රතිකර්ම ධෛර්යවත් කිරීම සහ දින 20ක් වයසැති දරුවෙකු ද ඇතුළුව කරන ලද බලහත්කාර ආදාහනයන් තුළින් සුළු ජාතික ප්‍රජාවන් ඉලක්ක බවට පත්කරමින් විද්‍යාත්මක සහ වෛද්‍ය උපදෙස් නොසලකන ලද හෙයින්ද ; 'ඉටුකම' කොවිඩ්-19 සෞඛ්‍ය ආරක්ෂණ සහ සමාජ ආරක්ෂණ අරමුදලේ ශේෂය 2020 ඔක්තෝබර් වනවිට රුපියල් බිලියන 1.659ක් ඉක්මවා තිබුණ ද රෝහල්වල රෝගීන් සඳහා වන වෛද්‍ය පහසුකම්වල විශාල හිඟයක් ඇතිවී ඇති හෙයින් ද;

අවශ්‍ය ගැසට් නිවේදන පළකිරීම් රහිතව කොවිඩ්-19 වසංගත සමයේ උච්ඡතම කාලසීමාව තුළ නීති විරෝධීව ප්‍රකාශයට පත් කරන ලද 'ඇඳිරි නීතිය' සහ 'නිරෝධායන ඇඳිරි නීතිය' බලාත්මක කිරීම සඳහා නීතියේ සඳහන් ක්‍රියාපටිපාටි අනුගමන කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වූ හෙයින් ද;

මාරාන්තික වයිරසය ශීඝ්‍ර ලෙස ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා එන්නත්කරණය ආරම්භ කිරීමට අවශ්‍ය එන්නත් ප්‍රමාණය ලබා ගැනීම සඳහා හදිසි සහ කාලීන පියවර ගැනීමට අපොහොසත් වීම සහ සිනොෆාම් එන්නත් මාත්‍රා එ.ජ.ඩොලර් 2.85කට ලබා ගැනීමට හැකිව තිබියදී එ.ජ.ඩොලර් 15කට මිලදී ගැනීම තුළ පැවති ආර්ථික හානිය තවත් අයහපත් තත්ත්වයට පත් කළ හෙයින් ද;

තම සොහොයුරු ගරු බැසිල් රාජපක්ෂ මහතාට එරෙහි වංචා සම්බන්ධයෙන් අධිකරණයේ නඩු විභාග වෙමින් තිබියදී ජනාධිපතිවරයා විසින් එතුමාව 2021 ජූලි මස මුදල් අමාත්‍යවරයා වශයෙන් පත් කළ හෙයින් ද;

ආර්ථික තීරණ ගැනීම සම්බන්ධයෙන් අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ විශ්වාසනීත්වයෙන් තොර වෘත්තීමය ඉතිහාසය නොසලකා හරිමින් 2021 සැප්තැම්බර් හෝ ඒ ආසන්න කාලයකදී අජිත් නිවාඩ් කබ්රාල් මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධුරයට පත් කළ හෙයින් ද;

ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සිලින්ඩරවල සංයුතිය වෙනස් කිරීම හේතුවෙන් මරණ සහ තුවාල සෑහෙන ප්‍රමාණයක් ඇති කරමින් ගෑස් සිලින්ඩර 730කට ආසන්න ප්‍රමාණයක් පිපිරුණු බවට වාර්තා වී ඇති හෙයින් ද;

ජනාධිපතිවරයා තාර්කික, විද්‍යාත්මක සහ විශේෂඥ උපදෙස් මත පදනම් ව තීරණ ගැනීමට අඛණ්ඩව අපොහොසත් වී ඇති හෙයින් සහ, ශාස්ත්‍රකාරියකගේ උපදෙස් ලබා ගැනීමට යොමුවෙමින්, ඇයගේ දේවාලය ඉදිකිරීම සඳහා මහජන මුදල් යොදා ගනිමින්, ඇයට හමුදා ආරක්ෂාව ද සපයා දී ඇති හෙයින් ද;

ජනාධිපතිවරයා 2022 අප්‍රේල් 01 දින හෝ ඒ ආසන්න දිනයක මහජන ආරක්ෂක ආඥා පනත යටතේ ඇති බලතල අවභාවිත කර, එම බලතල භාවිත කරමින් තමන්ගේ පුද්ගලික ආරක්ෂාව තකා නීති විරෝධී ලෙස හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරමින්, එමඟින් පුරවැසියන්ට සාමකාමී විරෝධතා පැවැත්වීමට ඇති නිදහස, සංචරණය සඳහා ඇති නිදහස, තමන් කැමති ආගමක් ඇදහීමට ඇති නිදහස, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම්වලින් ආරක්ෂා වී සිටීමේ නිදහස, සමාගමයේ නිදහස සහ නීත්‍යනුකූල ව්‍යාපාරවල නිරතවීමේ නිදහස යන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති හෙයින් ද;

2022 අප්‍රේල් 03 වැනි දින හෝ ඒ ආසන්න දිනයක පනවන ලද සමාජ මාධ්‍ය තහනමක් මඟින් පුරවැසියන්ට අත්‍යවශ්‍ය පුවත් යාවත්කාලීන කිරීම් සහ දෛනික විදුලිය කැපීමේ කාලසටහන වෙත පහසු ප්‍රවේශය ද ඇතුළුව තොරතුරු වෙත ප්‍රවේශය සඳහා ඇති අයිතිය ඇතුළු මූලික අයිතිවාසිකම් තවදුරටත් අහිමි කළ හෙයින් ද;

ජනාධිපතිවරයා විසින් ගනු ලැබූ නීති විරෝධී තීරණය පිළිබඳව පාර්ලිමේන්තුවේ දී ඡන්දයක් පවත්වන ලෙස ඉල්ලා සිටිමින් ජනාධිපතිවරයාව අභියෝගයට ලක් කරන ලද අවස්ථාවේ දී 2022 අප්‍රේල් 05 වන දින, හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම වහාම ප්‍රත්‍යාදිෂ්ඨ කළ හෙයින් ද;

2022 අප්‍රේල් 19 වන දින හෝ ඒ ආසන්න දිනයක දී, හදිසියේ ඉන්ධන මිල ඉහළ දැමීමට එරෙහිව උද්ඝෝෂණය කරමින්, විරෝධය දැක්වීම සඳහා තමන්ට ඇති අයිතිය ක්‍රියාත්මක කරමින් සිටි රඹුක්කන ප්‍රදේශයේ පුරවැසියන්ට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරින් විසින් වෙඩි තබනු ලැබීම හේතුවෙන් නිරායුධ සිවිල් වැසියන්ගෙන් එක් අයෙකු (01) මරණයට පත්ව, තිදෙනෙකු (03) බරපතළ තුවාල ලබා, තවත් බොහෝ දෙනෙකුට තුවාල සිදු වූ හෙයින් ද;

රටෙහි ආර්ථික තත්ත්වය උග්‍ර අතට හැරීමෙහි ප්‍රතිඵලයක් ලෙස අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල ඇති වූ දැඩි හිඟය හේතුවෙන් ජනතාව එම ද්‍රව්‍ය මිලදී ගැනීමට පෝලිම්වල සිටගෙන සිටිය දී පුරවැසියන් ගණනාවක් මරණයට පත් වූ හෙයින් ද;

රසායනික පොහොර භාවිතය හදිසියේ තහනම් කිරීම සහ අන්තර්ජාතික මූල්‍ය අරමුදලේ සහාය ලබා ගැනීමට ප්‍රමාද වීම තමන් අතින් සිදු වූ අත්වැරදීම් බව ජනාධිපතිවරයා විසින් පිළිගෙන ඇති හෙයින් සහ එම 'අත්වැරදීම්' දෙකම රටේ ආර්ථිකයට බරපතළ, අහිතකර බලපෑම් ඇති කර තිබෙන හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය යෝග්‍ය පරිදි ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුව අප්‍රසාදය පළ කරයි.

---